# ශ්‍රී ලංකාවේ දේශපාලන සංකල්ප හා සංස්ථා වර්ධනය කෙරෙහි කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ බලපෑම පිළිබඳව විමර්ශනයක්

## (ශ්‍රී ලංකාවේ වංසකතා හා සෙල්ලිපි ඇසුරෙන්)

ආර්. පී. ජේ. එන්. රාජපක්ෂ
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැළණිය විශ්වවිද්‍යාලය
jnawodi@gmail.com

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පුරාතනයේ පටන්ම විවිධාකාර සබඳතා පැවති බව මූලාශ්‍රය මඟින් හෙළිවේ. ලංකාවේ දේශපාලන පසුබිම සකස්වීමට ඉන්දීය ආභාසය ආරම්භයේ පටන් එක්වීමක්ද දක්නට ලැබෙන කාරණාවකි. ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය අධ්‍යනයේදී ඉන්දියානු දේශපාලන න්‍යාය ධර්මයන් ඇතුළත් ග්‍රන්ථයක් වන කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයෙහි බලපෑම කෙබඳු ලෙස බලපෑවේ ද යන වග පිළිබඳව සොයා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. මෙහිදී ප්‍රධාන වශයෙන් ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයගත කරුණු සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීම සිදු කරන ලදි.

මෙහි ඇතුළත් විවිධ වූ දේශපාලන දර්ශන සංකල්ප ලංකාවේ දේශපාලන සංස්ථා ආරම්භ වීමත්, වර්ධනයට පත්වීමටත් බලපෑ බවක් ලංකාවේ මූලාශ්‍රයන් මඟින් පෙනී යන්නකි. රාජත්වය, පාලන තන්ත්‍ර හා නිළධාරීන් පත්වීම, යුද්ධය හා සම්බන්ධ විවිධ වූ සංකල්ප හා සංස්ථාවල ආභාසය හා වර්ධනය වීමට කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයෙහි යම් යම් සිද්ධාන්ත ඉවහල් වූ බවක් මූලාශ්‍රමය තොරතුරු මඟින් අධ්‍යයනයේදී පෙනීයන කරුණකි. ලාංකීය පාලකයන් තම දේශපාලන අභිලාසයන් සාර්ථක කර ගැනීමට කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ සඳහන් මූලික සිද්ධාන්ත යොදාගත් බවක් පෙනී යයි. ඉන්දියාව වැනි විශාල රටකට ආසන්නයේ ශ්‍රී ලංකාව වැනි කුඩා දිවයිනක් පිහිටා තිබීම නිසා දෙරට අතර සම්බන්ධතා හේතුවෙන් ලංකාවේ බොහෝ අංශවල ඉන්දියානු අභාසය දක්නට ලැබෙන අතර ලංකාවේ දේශපාලන ඉතිහාසය තුළ ඉන්දියාවේ රචිත කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයෙහි සිද්ධාන්ත ලාංකික පාලකයන් තම පාලනය සඳහා උපයෝගී කරගත් බව පෙනේ.

**ප්‍රමුඛ පද - කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය, න්‍යායන්, දේශපාලන ඉතිහාසය, වංසකතා, සෙල්ලිපි**